# ආගමන සමයේ නුවානය
# දෙසැම්බර් 19

| පළමුවන කියවීම | විරාවලිය 13: 2-7, 24-25 |
|---|---|

*සැම්සන්ගේ උපත දේව දූතයන් සැළ කරයි.*

දාන්ගේ වංශයට අයිති ශොරාහි එක්තරා මිනිසෙක් සිටියේ ය. ඔහුගේ නම මානෝවා ය. ඔහුගේ භාර්යාව වඳ වූ බැවින් දරුවන් නොලැබ සිටියා ය. සමිඳාණන් වහන්සේගේ දූතයා ඒ ස්ත්‍රියට පෙනී මෙසේ කීවේ ය. "නුඹ වඳ ව දරුවන් නොලැබ සිටින්නෙහි ය. එහෙත් නුඹ පිළිසිඳගෙන පුත්‍රයෙකු ලබන්නෙහි ය. ඒ නිසා දැන් ඉතින් මුද්‍රික පානය වත්, සැර බීම වත්, නොබී අපවිත්‍ර දෙයක් නොකා සිටින හැටියට වග බලා ගන්න. මන්ද, නුඹ පිළිසිඳ පුත්‍රයෙකු ලබන්නෙහි ය. දැළි පිහියකින් ඔහුගේ කෙස් නොකැපිය යුතු ය. මන්ද, දරුවා ගර්භයේ පටන් දෙවියන් වහන්සේට කැප කරන ලද නාසරීයයෙකු විය යුතු බැවිනි. ඔහු පිලිස්තිවරුන්ගේ අතින් ඉශ්රායෙල්වරු ගළවා ගන්නේ ය." එවිට ඒ ස්ත්‍රිය ඇගේ පුරුෂයා වෙත අවුත් මෙසේ කීවා ය. "දෙවියන් වහන්සේට කැප වූ මනුෂ්‍යයෙක් මා ළඟට ආවේ ය. ඔහුගේ පෙනීම දේව දූතයෙකුගේ පෙනීම හා සමානව ප්‍රතාපවත් ව තිබුණේ ය. ඔහු කොතැනින් ආවේ ද කියා මම නො ඇසීමි. ඔහු තමාගේ නම මට දැන්වූයේ නැත. එහෙත්, ඔහු මට කතා කොට, "බලන්න, නුඹ පිළිසිඳගෙන පුත්‍රයෙකු ලබන්නෙහි ය. ඒ නිසා දැන් ඉතින් මුද්‍රික පානය වත්, සැර බීම වත් නොබී, අපවිත්‍ර කිසි දෙයක් නොකා සිටින්න. මන්ද, දරුවා ගර්භයේ පටන් මැරෙන දවස දක්වා දෙවියන් වහන්සේට කැප කරන ලද නාසරීයයෙකු විය යුතු ය" යි කීවේ ය. ඒ ස්ත්‍රිය පුත්‍රයෙකු ලැබූ පසු ඈ ඔහුට 'සම්සොන්' යන නම තැබුවා ය. දරුවා වැඩුණේ ය. සමිඳාණන් වහන්සේ ඔහුට ආශීර්වාද කළ සේක. සම්සොන් ශොරාටත්, එෂ්තායොල්ටත් අතරෙහි වූ දාන්ගේ කඳවුරේ සිටිය දී, සමිඳාණන් වහන්සේගේ ආත්මානුභාවය ඔහු ක්‍රියාවේ පොළඹවන්නට පටන් ගත්තේ ය.

*දේව වචනය මෙසේ ය.*

| පිළිතුරු ගීය | ගීතාවලිය 71: 3-6, 16-17 |
|---|---|

පිළිතුර: මාගේ මුඛය ඔබ වහන්සේගේ මහිමය ගායනා කරන්නේ ය.

ගීය: ඔබ මාගේ පර්වතය ද බලකොටුව ද වන බැවින්
ඔබ මට රැකවරණය දෙන පර්වතයක් වුව මැනව.
මා මුදාලන බලකොටුවක් වුව මැනව.
මාගේ දෙවිඳුනි, දුෂ්ටයන්ගේ බලයෙන් මා මුදා මැනව.

මහෝත්තම දෙවි ස්වාමිනි, ඔබ මාගේ බලාපොරොත්තුව වන සේක.
සමිඳුනි, මාගේ තරුණ වියේ සිට මාගේ විශ්වාසය ඔබ තුළ තැබුවෙමි.
උපන් දා සිට ඔබ මට පිහිට වූ සේක.
මවු කුසේ සිට ඔබ මා රැකගත් සේක.

මම ඔබ ගැන නිරතුරු ප්‍රශංසා කරන්නෙමි.
දෙවි සමිඳුනි, ඔබේ බල මහිමය මම පසසන්නෙමි.
ඔබේ ම, යහපත්කම මම ප්‍රකාශ කරන්නෙමි.
උපන් දා සිට ඔබ මට පිහිට වූ සේක.
මම අද දක්වා ඔබේ පුදුමාකාර ක්‍රියා වර්ණනා කළෙමි.

| සුපුවත් ජය නද |
|---|

ආලේලූයා! ආලේලූයා!
ජනතාවට දේව ආදරයේ සංකේතයක් මෙන් පිහිටුවන ලද ජේසුස්ගේ පෙළපතින් පැවතෙන තැනැත් වහන්ස, අප ගළවා ගැන්මට දැන් වඩිනු මැනව. තවත් පමා නොවනු මැනව.
ආලේලූයා!

| සුවිශේෂය | ලූක් 1: 5-25 |
|---|---|

සුවිශේසක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය මෙසේ ය.

*ජුවාම් තුමාගේ උපත ද දේව දූතයෙක් සැළ කරයි.*

ජුදාහි රජ වූ හෙරෝද්ගේ කාලයෙහි අබියාගේ පේරුවට අයත් සෙකරියස් නම් එක් පූජක නමක් විය. ඔහුට ආරොන්ගේ පෙළපතෙන් බිරිඳක් වූවා ය. ඇගේ නම

එලිසබෙත් ය. මේ යුවල ස්වාමින් වහන්සේගේ සියලු ආඥා හා නියෝග නිවැරැදි ව පිළිපදිමින් දෙවියන් වහන්සේ අබිමුවෙහි දැහැමින් විසූ හ. එලිසබෙත් වඳ ව සිටි බැවින් ඔවුන්ට දරු සම්පතක් නොවී ය. ඇරත් ඒ දෙපොළ වයස්ගත ව සිටියහ. සෙකරියස්ගේ පේරුවේ අයට දෙවියන් වහන්සේ ඉදිරියෙහි පූජක කටයුතු කරන අවස්ථාව පැමිණි විට පූජක නිල පිළිවෙලින් ස්වාමින් වහන්සේ ගේ ශුද්ධස්ථානයට පිවිස සුවඳ දුම් පූජා කිරීමේ වාරය දාදු දැමීමෙන් සෙකරියාස්ට පැවරිණි. සුවඳ දුම් පූජා පවත්වන වේලෙහි මුළු පිරිස පිටත යාච්ඤා කරමින් උන්හ. එවිට දුම් පූජාසනයට දකුණු පසින් ස්වාමින් වහන්සේගේ දූතයෙක් ඔහුට දර්ශනය විය. සෙකරියස් ඔහු දැක කැලඹී බියපත් විය. දේව දූතයා ඔහුට කතා කොට, "සෙකරියස්, බිය නොවන්න. මන්ද, ඔබේ යාච්ඤාව අසනු ලැබීය. ඔබේ බිරිඳ වන එලිසබෙත් ඔබගෙන් පුතකු ලබන්නී ය. ඔහුට ජුවාම් යයි නම් තබන්න. සතුට හා සොම්නස ඔබට ඇති වේ. බොහෝ දෙන ඔහුගේ උත්පත්තිය නිමිත්තෙන් ප්‍රීති වෙන්නා හ. මන්ද, ඔහු ස්වාමින් වහන්සේ අබිමුවෙහි ශ්‍රේෂ්ඨ වන්නේ ය. ඔහු මිදි යුෂ වත් මත්පැන් වත් නොබොන්නේ ය. මව් කුස සිට ම ඔහු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වන්නේ ය. ඔහු ඉශ්රායෙල්වරුන් බොහෝ දෙනෙකු ඔවුන්ගේ දෙව් ස්වාමින් වහන්සේ වෙත හරවන්නේ ය. ඔහු මව්පියන් හා දරුවන් සමගි කරවන පිණිස ද නොදැමුණු ජනයන් දම්වුන්ගේ ප්‍රඥාවට හරවන පිණිස ද සැදී පැහැදී සිටින සෙනගක් ස්වාමින් වහන්සේට සූදානම් කර දෙන පිණිස ද, එලියාගේ ආත්මානුභාමයෙන් හා බලයෙන් උන් වහන්සේට පෙරටුව යන්නේ ය" යි කීය.

එවිට සෙකරියස්, දේව දූතයා අමතමින්, "මා මෙය දැන ගන්නේ කෙසේද? මම මහල්ලෙක්මි. මාගේ භාර්යාව ද වයස්ගත ව සිටී ය" යි කීය. දේව දූතයා පිළිතුරු දෙමින්, "දෙවියන් වහන්සේ අබිමුවෙහි සේවා කරන ගාබ්‍රියෙල් මම ය. මා එවන ලද්දේ ඔබ සමග කතා කරන්නටත්, මේ සුභ ආරංචිය ඔබට පවසන්නටත් ය. බලන්න, නියම කාලයෙහි ඉටුවන්න යන, මා කී දේ ඔබ අවිශ්වාස කළ බැවින්,

මේ කාරණා සිදුවන දවස දක්වා ඔබ කතා කළ නොහැකි ව නිහඬ වනු ඇතැ" යි කී ය. සෙකරියස් එන තෙක් බලා සිටි සමූහයා ඔහු ශුද්ධස්ථානයෙහි පමා වීම ගැන මවිත වූ හ. ඔහු පිට වී ආ කල ඔවුන් සමග කතා කිරීමට අපොහොසත් විය. ඔහු පූජා ස්ථානයෙහි යම්කිසි දර්ශනයක් දක්නය ඇතැ යි ඔව්හු තේරුම් ගත්හ. ඔහු ද අතින් සංඥා කරමින් ගොළු ගැසී සිටියේ ය. සේවා කාලය නිම වූ පසු ඔහු සිය නිවෙසට ගියේ ය.

මඳ කලකට පසු ඔහුගේ බිරිඳ වන එලිසබෙත් ගැබ් ගෙන, පස් මසක් රහසිගතව වෙසෙමින්, "ලෝකයා අතර පැවති මාගේ නින්දාව පහ කරනු වස් ස්වාමින් වහන්සේ මෙකල මා දෙස කරුණාවෙන් බලා මේ දේ කළ සේකැ" යි කීවා ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*